ශ්‍රී ලංකා නීතිඥ සංගමය
இலங்கைச் சட்டத்தரணிகள் சங்கம்
BAR ASSOCIATION OF SRI LANKA

2021 ජූනි 24 දින.

**<u>අතිගරු ජනාධිපතිතුමා විසින් දුමින්ද සිල්වාට ලබාදෙන ලද සමාව පිළිබඳ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විධායක කමිටුවේ නිවේදනය</u>**

නීති විරෝධී රැස්වීම හා මිනීමැරීම සම්බන්ධයෙන් ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ලක් විසින් දණ්ඩනයට ලක්කරන ලදුව, එවකට අග්‍ර විනිශ්වයකාර ප්‍රියසත් ඩෙප් මහතා සභාපතිත්වය හොබන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මඬුල්ලක් විසින් අනුමත කරන ලද තීන්දුවක් අනුව, සිරගත කර සිටි සිරකරුවකු වන දුමින්ද සිල්වා වෙත <u>අති</u>ගරු ජනාධිපතිතුමා විසින් ලබාදෙන ලද සමාව කෙරෙහි ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ (BASL) විධායක කමිටුවේ අවධානය යොමුවී ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයාට පූර්ණ හෝ කොන්දේසිවලට යටත්ව එවැනි සමාවක් ප්‍රදානය කිරීමේ හැකියාව තිබුනද, එම ව්‍යවස්ථාවේ අතුරු විධාන අනුව, ජනාධිපතිවරයා විසින් මරණීය දණ්ඩනය නියම කරන ලද වැරදිකරුවෙකුට සමාව දීමේදී, නඩුව විභාග කරන ලද විනිශ්වයකාරවරුන් වෙතින් වාර්තාවක් කැඳවිය යුතු අතර එම වාර්තාව නීතිපතිවරයාගේ උපදෙස් පිණිස යොමුකළ යුතුය. නීතිපතිවරයාගේ උපදෙස් අධිකරණ ඇමතිවරයා වෙත යොමු කළ යුතු අතර, ඇමතිවරයා විසින් ද ජනාධිපතිවරයා වෙත නිර්දේශයක් ඉදිරිපත් කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද සමාව පිරිනමනු ලැබුවේ නඩුව විභාග කළ විනිශ්වයකාරවරුන්ගේ වාර්තාව, නීතිපතිවරයාගේ උපදෙස් සහ ගරු අධිකරණ අමාත්‍යවරයාගේ නිර්දේශය අනුවද යන්න දැනගැනීමට මහජනයාට අයිතියක් තිබේ. ඒ අනුව ශ්‍රී ලංකා නීතිඥ සංගමය අතිගරු ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමුකරමින් එවැනි වාර්තාවක්, උපදෙසක් හෝ නිර්දේශයක් තිබේද, එසේ තිබේ නම්, ඔවුන් විසින් ඇත්ත වශයෙන්ම එවැනි සමාවක් දුමින්ද සිල්වාට ලබාදීමට නිර්දේශ කර තිබේද නැද්ද යන්න විමසා සිටියි.

<u>අති</u>ගරු ජනාධිපතිවරයාට එවැනි සමාවක් ලබාදීම සඳහා අභිමතය හා බලය තිබුනද. එම අභිමතය හැමවිටම භාවිතා කළ යුත්තේ නීතියට අනුකූලවය. එවැනි බලයක් අත්තනෝමතික හෝ විශේෂයක් දක්වමින් ක්‍රියාත්මක නොකළ යුතුය.

අතීතයේදී ද තෝරාගැනීමේ පදනම සාධාරණීකරණය කරන කිසිදු පැහැදිලි කිරීමක් නොමැතිව, සාධාරණ හේතු නොමැතිව, තෝරාගත් පුද්ගලයන්ට සමාව පිරිනැමීම සිදුවී තිබෙන බවද ශ්‍රී ලංකා නීතිඥ සංගමය සිහිපත් කරයි. ශ්‍රී ලංකා නීතිඥ සංගමය එවැනි අවස්ථාවලදී ද වර්තමානයේ ගනු ලබන ස්ථාවරයම ගෙන තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 ව්‍යවස්ථාව නියමානුකූලව ඕනෑම සමාවක් ලබාදිය යුතු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34(1) අතුරු විධානය ප්‍රකාරව එවැනි සමාවක් ලබාදීම සඳහා තිබෙන අවශ්‍යතාව සුපරික්ෂාකාරීව විශ්ලේෂණය කිරීමෙන් පසුවයි.

ඉහත විස්තර කරන ලද පසුබිම තුළ, ශ්‍රී ලංකා නීතිඥ සංගමය අතිගරු ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමුකරමින් පහත දැක්වෙන කරුණු ශ්‍රී ලංකා නීතිඥ සංගමයට හා පොදු ජනතාවට දන්වන ලෙස ඉල්ලා සිටියි:



President
Saliya Pieris PC
Deputy President
Anura Meddegoda PC
Secretary
Rajeev Amarasuriya
Treasurer
Rajindh Perera
Assistant Secretary
Pasindu Silva

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2448090 E-mail: basl.lawnet@gmail.com Web: www.basl.lk

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34(1) ව්‍යවස්ථාව යටතේ සමාවක් ලබාදීමේ අරමුණ සඳහා දුමින්ද සිල්වා තෝරාගත් පදනම;

(ආ) එකී සමාව ප්‍රධානය කිරීම සඳහා සැලකිල්ලට ගත් කරුණු සහ තත්වයන්;

(ඇ) වර්තමානයේදී දඬුවම් ලබාදී තිබෙන නඩු අතරින් දුමින්ද සිල්වාගේ නඩුව සුවිශේෂ වීමට හේතුව;

(ඈ) අතිගරු ජනාධිපතිතුමන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34(1) ව්‍යවස්ථාව යටතේ දුමින්ද සිල්වාට සමාවක් ලබාදීමට පෙර නඩුව විභාග කළ විනිසුරුවරුන්ගෙන් වාර්තාවක් කැඳවූවාද යන කාරණය හා එවැනි වාර්තාවක අන්තර්ගතය;

(ඉ) දුමින්ද සිල්වාට සමාවක් ලබාදීමට පෙර නීතිපතිවරයාගේ උපදෙස් ලබාගත්තාද යන කාරණය හා එවැනි උපදෙසක අන්තර්ගතය;

(ඊ) දුමින්ද සිල්වාට සමාවක් ලබාදීමට පෙර අධිකරණ ඇමතිවරයාගේ නිර්දේශය ලබාගත්තාද යන කාරණය හා එසේ ලබාගත්තා නම්, දුමින්ද සිල්වා නිදහස් කිරීමට අධිකරණ ඇමතිවරයා නිර්දේශ කළාද යන වග.

මෙම කාරණය  සම්බන්ධයෙන් ඉහත දක්වන ලද කරුණු එකක් හෝ කීපයක් සංතෘප්ත නොවේ නම්, දුමින්ද සිල්වාට ලබාදුන් සමාව අසාධාරණ හා අත්තනෝමතික වන බව ද, නීතියේ ආධිපත්‍යය පිරිහීමට හේතු විය හැකි බව ද, යුක්තියේ පරිපාලනය සම්බන්ධයෙන් ඇති මහජන විශ්වාසය බිඳවැටීමට හේතු විය හැකි බව ද ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ මතයයි.

ස්තූතියි,

**රජීව් අමරසූරිය**
**ලේකම්**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**



President Saliya Pieris PC | Deputy President Anura Meddegoda PC | Secretary Rajeev Amarasuriya | Treasurer Rajindh Perera | Assistant Secretary Pasindu Silva

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2448090 E-mail: basl.lawnet@gmail.com Web: www.basl.lk